**මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

**முஸ்லிம் சமய பண்பாட்டு அலுவல்கள் திணைக்களம்**

**Department of Muslim Religious and Cultural Affairs.**

# කාර්ය සාධන වාර්තාව - 2014

## முன்னேற்ற அறிக்கை - 2014

# Annual Performance Report – 2014

**වැය ශීර්ෂය - 202**

**செலவினத் தலைப்பு - 202**

Expenditure Head - 202

**මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව**
**අංක 180, ටී.බී. ජායා මාවත,**
**කොළඹ 10.**

## දැක්ම

ශ්‍රී ලංකාව තුළ
ඉස්ලාමීය ආගමික සාරධර්ම හා සංස්කෘතික
වටිනාකම් අතින් පිරිපුන්
ඉතා උසස් මුස්ලිම්
ජන සමාජයක්.

## මෙහෙවර

ශ්‍රී ලාංකික මුස්ලිම් ජන සමාජයේ
උන්නතිය සහ යහ පැවැත්ම උදෙසා
සියලු කාර්යයන්
මැනවින් සංවිධානය කිරීම,
මුස්ලිම් ආගමික හා සංස්කෘතික ආයතන
සම්බන්ධීකරණය හා මෙහෙයවීම
සහ
වකුෆ් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම මගින්
ඉතා උසස් මුස්ලිම් ජන සමාජයක්
බිහි කිරීමට උරදීම.

## පටුන


| | |
|---|---|
| | **පිටු අංක** |
| 1. හැඳින්වීම | 4 |
| 2. දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යභාරය | 5-6 |
| 2.1 අරමුණු | |
| 2.2 දෙපාර්තමේන්තු කාර්යභාරය | |
| 3. සංවිධාන ව්‍යුහය | 7 |
| 4. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල විස්තර | 8 |
| 4.1 අනුමත කාර්ය මණ්ඩලය | |
| 4.2 වර්ෂය තුළ කාර්ය මණ්ඩල වෙනස්වීම් | |
| 5. පරිපාලන හා සංවර්ධන අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන් | 9-11 |
| 5.1 පරිපාලන ශාඛාව මඟින් ඉටු කරන ලද කාර්යයන් | |
| 5.1.1 පුහුණු වැඩසටහහන් | |
| 5.1.2 විදේශීය පුහුණු වැඩසටහන් | |
| 5.2 සංවර්ධන ශාඛාව මගින් ඉටු කරන ලද කාර්යයන් | |
| *6.* මූල්‍ය අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන් සහ මූල්‍ය වාර්තා | 11-13 |
| 6.1 මූල්‍ය අංශය මඟින් ඉටුකරන ලද කාර්යයන් | |
| 6.2 මූල්‍ය වාර්තා | |
| 6.2.1 පුනරාවර්තන | |
| 6.2.2 මූලධන | |
| 6.2.3 අත්තිකාරම් ගිණුම් | |
| 7. ආගමික හා සංස්කෘතික කටයුතු අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්. | 14-15 |
| 8. වකුෆ් හා පල්ලි පරිපාලන අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්. | 16 |
| 9. අභ්‍යන්තර විගණන හා විමර්ෂන අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන් | 16 |
| 10. දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි වූ බාධාවන් සහ දුෂ්කරතා | 17 |

## 01. හැඳින්වීම

**බුද්ධශාසන හා ආගමික කටයුතු** අමාත්‍යාංශය යටතේ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාත්මක ආයතනය ලෙස මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ශ්‍රී ලංකාව තුල ඉස්ලාමීය ආගමික සාරධර්ම හා සංස්කෘතික වටිනාකම් අතින් පිරිපුන් ඉතා උසස් මුස්ලිම් ජන සමාජයක් ඇති කිරීමේ "දැක්ම" පෙරදැරිව මුස්ලිම් ජන සමාජයේ උන්නතිය සහ යහපැවැත්ම උදෙසා සමස්ත කාර්යභාරය නියාමනය කිරීමේ වගකීමට මෙම දෙපාර්තමේන්තුව උරදරා සිටී.

1962 අංක 21 හා 1982 අංක 33 දරන පනත් මගින් සංශෝධිත 1956 අංක 51 දරන වකුෆ් පනතින් අරමුණු කරගත් කාර්යභාරයන් ඉටුකිරීමෙහිලා ස්ථාපනය කර ඇති ශ්‍රී ලංකා වකුෆ් සභාව හා වකුෆ් විනිශ්චය සභාව යන ආයතනයන් සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් වකුෆ් පනතේ අරමුණු ප්‍රකාර මුස්ලිම් පල්ලි, සිද්ධස්ථාන හා ආගමික ආයතන ලියාපදිංචි කිරීම, ලියාපදිංචි මුස්ලිම් ආගමික ස්ථානවල හා මුස්ලිම් පුණ්‍යාභාරවල හෝ වකුෆ් භාරවල භාරකරුවන්ගේ බලතල, කාර්ය හා කර්තව්‍ය නියම කිරීම, මුස්ලිම් පුණ්‍යාභාර අරමුදල් පවත්වාගෙන යාම යන කරුණු මැනවින් ඉටුවන අයුරින් පරිපාලන කටයුතු දියත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය තුල අන්තර්ගත වී ඇත. වකුෆ් පනතින් විධිවිධාන සලසන ලද පරිපාලන ක්‍රියාකාරකම් ආවරණය කරමින්, මුස්ලිම් ආගමික හා සංස්කෘතික අනන්‍යතාවය සුරක්ෂණයට අවශ්‍ය පියවර ගනිමින් ජන සමාජයේ යහපත උදෙසා සුභසාධක පහසුකම් සලසමින් සියලුතන්හි ක්‍රියාත්මක වේ.

## 02. දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යභාරය

### 2.1 අරමුණු :

1. මුස්ලිම් පල්ලි, පුණ්‍යාධාර අරමුදල හා ඒවායේ වත්කම් පාලනය හා මෙහෙයවීම.
2. ඉස්ලාම් ආගමික ආයතන හා ඒවායේ වත්කම් පාලනය හා මෙහෙයවීම.
3. ඉස්ලාමීය ආගමික අධ්‍යාපනය පෝෂණය කිරීම හා වර්ධනය කිරීම.
4. ඉස්ලාමීය සංස්කෘතික අංග/ කටයුතු පෝෂණය කිරීම හා වර්ධනය කිරීම.
5. හජ් වන්දනාකරුවන් සඳහා පහසුකම් හා සේවා සම්පාදනය කිරීම.
6. ඉස්ලාමීය ආගමික හා සංස්කෘතික ක්ෂේත්‍රවලදී ජන සමාජයට සේවාවක් කිරීම.
7. ඉස්ලාම් ආගමික ශික්ෂණයන් ඉටුකිරීම සඳහා (පස්වේල් නමස්කාර කිරීම සහ රාමසාන් උපවාසය වැනි) අවශ්‍ය පහසුකම් සම්පාදනය කිරීම.
8. කාලීන කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ මාර්ගෝපදේශ ලබාදීම.
9. මුස්ලිම් ජන සමාජයේ එකමුතු බව පවත්වාගෙන යාම සහ ජාතික ඒකාබද්ධතාව සඳහා ක්‍රියාකිරීම.

### 2.2 දෙපාර්තමේන්තු කාර්යභාරය

1. මුස්ලිම් පල්ලි ඇතුළු ආගමික ස්ථාන ලියාපදිංචිය සහ භාරකරුවන් පත්කිරීම.

2. මුස්ලිම් පුණ්‍යාධාර භාර අරමුදල ක්‍රියාකාරී ලෙස පවත්වාගෙන යාම සහ වකුෆ් පනත ක්‍රියාත්මක කිරීම.

3. ලියාපදිංචි කරන ලද මුස්ලිම් දේවස්ථාන, අහදියා (දහම් පාසල්), අරාබි විදුහල්, කුර්ආන් මද්රසා ඇතුළු ආගමික ආයතන සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය ආධාර ලබාදීම.

4. ශුද්ධ වූ රාමසාන් මාසයේ ආරම්භය සහ සමාප්තිය නිවේදනය කිරීම සහ ''රාමසාන්'' මාසය වෙනුවෙන් විදේශ මුස්ලිම් රටවල්වලින් මෙරටට ප්‍රදානය කරනු ලබන රටඉඳි දිස්ත්‍රික් මට්ටමින් අදාල ප්‍රධාන දේවස්ථාන හරහා දිවයින පුරා සිටින මුස්ලිම් ජනතාවට බෙදාහැරීම.

5. ජාතික මීලාදුන් නබී දිනය සනිටුහන් කරමින් සෑම වසරක් පාසාම දිවයිනේ එක් දිස්ත්‍රික්කයක් තෝරාගෙන එම දිස්ත්‍රික්කය පුරා ආගමික හා සමාජයීය සංවර්ධනය ඇති කිරීම. එහිදී අදාල ප්‍රදේශය මුස්ලිම් දේවස්ථාන, ආගමික ආයතන, මුස්ලිම් සහ මුස්ලිම් නොවන පාසල්වල සංවර්ධන කටයුතු සිදුකිරීම, විවිධ වැඩසටහන්, තරඟ හා ත්‍යාග ප්‍රදානෝත්සව සංවිධානය කිරීම, ආගමික පුරෝගාමීන්ට ගෞරවාචාරය පුදකිරීම, අදාල ප්‍රදේශයේ ඓතිහාසික වශයෙන් වැදගත් පොත් ප්‍රකාශනය යනාදී ක්‍රියාකාරකම් සිදුකෙරේ.

6. ශ්‍රී ලාංකික මුස්ලිම් ජනතාව ශුද්ධ වූ හජ් වන්දනාවෙහි යෙදීම සඳහා පහත පරිදි අවශ්‍ය කටයුතු සලසාදීම.
    - සුදුසු නියෝජිතයන් ලියාපදිංචිය සහ බලපත්‍ර නිකුත් කිරීම.
    - වැඩසටහන පිළිබඳව වන්දනාකරුවන් දැනුවත් කිරීම.
    - හජ් වන්දනාව පිළිබඳ මාර්ගෝපදේශන පොත් බෙදාහැරීම.
    - වන්දනාකරුවන් සඳහා ගුවන් ප්‍රවාහන කටයුතු සංවිධානය.
    - හජ් වන්දනාව සඳහා සෞදි අරාබි රාජධානියේ රැඳී සිටින කාලය තුල වන්දනාකරුවන්ට අවශ්‍ය පහසුකම් සැලසීම සහ මාර්ගෝපදේශ ලබා දීම.
    - හජ් වන්දනා කාලය තුල වන්දනාකරුවන් සඳහා වෛද්‍ය සේවා කටයුතු සලසාදීම.

- බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළේදී සහ ජිද්දා අන්තර්ජාතික ගුවන්තොටුපළේදී හජ් වන්දනාකරුවන්ට මගපෙන්වීම සහ අවශ්‍ය පහසුකම් සලසාදීම.
- සෞදි අරාබි රාජධානියේදී හජ් නියෝජිතයින් සලසන සේවාවන් නිරීක්ෂණය කිරීම සහ අඩුපාඩු නිවැරදි කිරීම.


7. දිවයින පුරා අහදියා දහම් පාසල් ගුරුභවතුන් සඳහා නිල ඇඳුම්, පුස්තකාල පොත් දීමනා ලබාදීම, දහම් පාසල් ගුරුභවතුන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම සහ අහදියා දහම් පාසල් සඳහා විෂය නිර්දේශයක් හඳුන්වාදීම.
8. මුස්ලිම් සුභසාධන සමිති ලියාපදිංචිය සහ එම කටයුතු පවත්වාගෙන යාමට දායකවීම.
9. ඉස්ලාම් පෙර පාසල් ගුරුවරුන් සඳහා පුහුණුවක් ලබාදීම සහ එම කටයුතු පවත්වාගෙන යාමට දායකවීම.
10. කලාකරුවන්ට ගෞරව සත්කාර දැක්වීම පිණිස වාර්ෂිකව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කලාභූෂණ සම්මාන උළෙල සඳහා සුදුසු කලාකරුවන් නිර්දේශ කිරීම.
11. මුස්ලිම් කතුවරුන් ධෛර්යමත් කිරීම සඳහා ඔවුන් විසින් නිර්මාණය කරන ලද පොත් පත් මිලදී ගෙන මුස්ලිම් පාසල් පුස්තකාලවලට බෙදාහැරීම.
12. පල්ලි දායක සහා සාමාජිකයන්ට ඉස්ලාම් ආගමික ආයතනවල පරිපාලන සහා සාමාජිකයන්ට පුහුණුවක් ලබාදීම.
13. අන්තර්ජාතික තරඟ සඳහා (අල්කුර්ආනය පාරායණය කිරීම) අපේක්ෂකයින් තේරීම. මෙම තරඟ වාර්ෂිකව ඊජිප්තුව, ඉරානය, මැලේසියාව සහ ඩුබායි යන විදෙස් රටවල්වලදී පැවැත්වේ.
14. ඉස්ලාමීය උසස් අධ්‍යාපන කටයුතු සඳහා සිසුන් තේරීම.
15. ඉස්ලාම් ආගමික පූජකවරුන් (මවුලවිවරු) සඳහා විශේෂ හැඳුනුම්පත් ලබාදීම.
16. විදේශ රැකියා සඳහා සෞදි අරාබිය බලා පිටත්ව යන මුස්ලිම් ජාතිකයන් වෙනුවෙන් ඔවුනගේ ජන වර්ගය තහවුරු කිරීම සඳහා ආගමික සහතිකපත් නිකුත් කිරීම.

## 03. සංවිධාන ව්‍යුහය

ඉහත කාර්යභාරය සාධනය උදෙසා ප්‍රධාන අංශ 05කින් සමන්විත වන අයුරින් මෙම දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය සකස්කර ඇති අතර, අදාල අංශ පහත සඳහන් පරිදි වේ.

1. පරිපාලන හා සංවර්ධන අංශය
2. මූල්‍ය අංශය
3. ආගමික හා සංස්කෘතික කටයුතු අංශය
4. වකුෆ් අංශය
5. අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය

## සංවිධාන ව්‍යුහය
## මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව



## 04. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල විස්තර

### 4.1 අනුමත කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය තුල අනුමත කාර්ය මණ්ඩලය 117ක් වන අතර, 2014.12.31 දිනට අදාල කාර්ය මණ්ඩල විස්තර පහත දැක්වේ.

| අනු. අංකය | තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | ස්ථිර | අනියම් | |
| 01 | අධ්‍යක්ෂ | 01 | 01 | - | 0 |
| 02 | ගණකාධිකාරී | 01 | 01 | - | 0 |
| 03 | නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ.) | 02 | 01 | - | 01 |
| 04 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ.නොවන) | 02 | 0 | - | 02 |
| 05 | පරිපාලන නිලධාරී | 01 | 0 | - | 01 |
| 06 | භාෂා පරිවර්තක (සිං/දෙ) | 01 | 0 | - | 01 |
| 07 | වකුෆ් මණ්ඩල ලේකම් | 01 | 0 | - | 01 |
| 08 | වකුෆ් විනිශ්චය සභා ලේකම් | 01 | 0 | - | 01 |
| 09 | විමර්ශන නිලධාරී | 02 | 0 | - | 02 |
| 10 | සංස්කෘතික නිලධාරී | 03 | 03 | - | 0 |
| 11 | සංස්කෘතික සහකාර | 15 | 08 | - | 07 |
| 12 | පුණ්‍යාධාර සහකාර | 01 | 01 | - | 0 |
| 13 | සංවර්ධන නිලධාරී | 50 | 24 | - | 26 |
| 13 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 20 | 16 | - | 04 |
| 14 | රියදුරු | 03 | 03 | - | 0 |
| 15 | කා.කා.ස. | 13 | 15 | | 02 ( අතිරික්තය) |
| | **එකතුව** | **117** | **73** | | **44** |

### 4.2 වර්ෂය තුළ කාර්ය මණ්ඩල වෙනස්වීම්

**2014 වර්ෂය තුළ කාර්ය මණ්ඩල වෙනස්වීම්**

| | | |
|---|---|---|
| ස්ථාන මාරුවීම් | පැමිණීම් | 04 |
| | පිටවීම් | 04 |
| පත් කිරීම් | ස්ථිර | 12 |
| | අනියම් | - |
| උසස් කිරීම් | - | |
| සේවයෙන් පහ කිරීම් | - | |
| තනතුරු අතහැර යාම් | - | |
| ඉල්ලා අස්වීම් | 02 | |
| විශ්‍රාම ගැනීම් | 01 | |
| මිය යෑම් | - | |
| වෙනත් | - | |

## 05.පරිපාලන හා සංවර්ධන අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්

### 5.1 පරිපාලන ශාඛාව මඟින් ඉටු කරන ලද කාර්යයන්

දෙපාර්තමේන්තුවට අයත් සියළුම තනතුරු හා සේවාවන්ට අයත් පත් කිරීමේ සිට විශ්‍රාම යාම දක්වා වූ ස්ථාන මාරු කිරීම්, උසස් කිරීම්, විනය කටයුතු සේවා දීර්ඝ කිරීම ආදි රාජකාරි කටයුතු මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව යන ආයතන අවශ්‍ය පරිදි සම්බන්ධීකරණය කර ගනිමින් සිදු කිරීම.

- දෙපාර්තමේන්තුවට අදාල බඳවා ගැනීමේ පරිපාටි සකස් කර, නිර්දේශ ලබා ගැනීම සහ අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.
- පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම.
- තැපැල.
- දේශීය හා විදේශීය නිවාඩු සම්බන්ධ කටයුතු.
- දුම්රිය බලපත්‍ර / දුම්රිය අනුග්‍රහ වාරප්‍රවේශපත්‍ර සම්බන්ධ කටයුතු.
- වාහන නඩත්තුව සහ ප්‍රවාහන පහසුකම් සැපයීම/ උපදේශක කාරක සභා සඳහා පිළිතුරු සැපයීම.
- මැතිවරණ රාජකාරි කටයුතු.
- පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම හා ඒ සඳහා යොමු කිරීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම.
- කාර්යාල උපකරණ නඩත්තු කටයුතු.
- කාර්යාල ගොඩනැගිලි නඩත්තු කටයුතු.
- අග්‍රහාර රක්ෂණ කටයුතු.
- ණය අත්තිකාරම් අනුමත කිරීම.

#### 5.1.1 පුහුණු වැඩසටහන්

**2014 වර්ෂයේදී මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තු නිලධාරීන් සහභාගී වූ දේශීය පුහුණු වැඩසටහන්**

| අනු අංකය | පුහුණු වැඩසටහනේ නම | පවත්වන ලද ආයතනය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | කාලය (දින) |
|---|---|---|---|---|
| 1 | කාර්යාල කළමනාකරණය සඳහා නව ප්‍රවේශයක් | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 02 | 02 |
| 2 | ව්‍යාපාරික ලිපි ලිවීම හැකියා වර්ධනය සඳහා පුහුණු වැඩසටහන | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 02 | 01 |
| 3 | විශ්‍රාම වැටුප් පිළිබඳ පුහුණු වැඩසටහන | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 | 02 |
| 4 | ජාතික කළමනාකරණ සම්මන්ත්‍රණය | ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනය | 01 | 180 |
| 5 | රජයේ ගිණුම්කරණ පරිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 02 | 01 |
| 6 | සහජීවන නුවණ පිළිබඳ වැඩසටහන | ශ්‍රී ලංකා පදනම | 01 | 03 |
| 7 | රාජ්‍ය භාෂා පුහුණු වැඩසටහන | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 01 | මාස 6 |
| 8 | කාර්යාල ක්‍රම සහ රජයේ මුදල් රෙගුලාසි පිළිබඳ කාර්ය මංඩල පුහුණු වැඩසටහන | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 50 | 01 |

## 5.1.2 විදේශීය පුහුණු වැඩසටහන්

| අනු අංකය | පුහුණු වැඩසටහනේ නම | පවත්වන ලද ආයතනය හා රට | සහභාගී වූ නිලධාරින් සංඛ්‍යාව | කාලය |
|---|---|---|---|---|
| 1 | ලෝක ඉස්ලාම් පූජකවරුන් සහ ඉමාම්වරුන් සඳහා පුහුණු වැඩසටහන | අල් - අස්හර් විශ්ව විද්‍යාලය, ඊජිප්තුව | 01 | මාස 03 |

## 5.2 සංවර්ධන ශාඛාව මගින් ඉටු කරන ලද කාර්යයන්

- මුස්ලිම් පල්ලි සංවර්ධනය හා වැඩිදියුණු කිරිම.
- දහම් පාසල්, අරාබි විදුහල් සහ කුර්ආන් මද්රාසා සංවර්ධනය හා වැඩිදියුණු කිරිම.

**දිවයින පුරා පිහිටි ආගමික ස්ථාන සංවර්ධන වැඩසටහන**

| ආගමික ස්ථානය | 2014 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මිලියන) | ඉලක්කගත දේවස්ථාන ගණන | 2014.12.31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | භෞතික | මූල්‍ය (රු.මිලියන) |
| 1. මුස්ලිම් පල්ලි | 5.10 | 48 | 43 | 5.05 |
| 2. අරාබි විදුහල් | 0.38 | 04 | 03 | 0.20 |
| 3. අහදියා දහම් පාසල්, හිෆ්ලුල් කුර්ආන් මද්රසා සහ වෙනත් ආගමික ආයතන | 0.51 | 08 | 07 | 0.50 |

- වාර්ෂික මිලාද් සංවර්ධන වැඩසටහන සංවිධානය සහ ක්‍රියාත්මක කිරිම - 2014 වර්ෂයේදි මෙම වැඩසටහන lකලුතර දිස්ත්‍රික්කය තෝරාගෙන ක්‍රියාත්මක කල අතර ඒ සඳහා රු. මිලියන 13ක් වෙන්කර ඇති අතර පහත දැක්වෙන පරිදි සංවර්ධන කටයුතු සිදු කරන ලදි.

❖ දැයට කිරුළ සංවර්ධන වැඩසටහන


2014.02.20 දින සිට 2014.03.02 දින දක්වා කුලියාපිටිය තාක්ෂණ විද්‍යාලය හා වයඹ විශ්ව විද්‍යාල පරිශ්‍රයේදී පැවති රට දිනන-හෙට දිනට ආශ්චර්යයේ පුනරාගමනය -"දැයට කිරුළ" ජාතික ප්‍රදර්ශනය වෙනුවෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යමින් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා මුස්ලිම් ආගමික හා සංස්කෘතික අනන්‍යතාවයන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

❖ යෝජිත මුස්ලිම් සංස්කෘතික සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු

කොළඹ 10, ටී.බී. ජායා මාවත, අංක 180 යන ස්ථානයේ ඉදිවෙමින් පවතින යෝජිත මුස්ලිම් සංස්කෘතික සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු 2006.11.09 වන දින ආරම්භ වූ අතර මේ සඳහා ඇස්තමේන්තුගත මුදල් රුපියල් මිලියන 596කි. මෙම සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට පවරා ඇත.
මහල් 9කින් යුත් මෙම සංකීර්ණය මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යාලය, ශ්‍රී ලංකා වකුෆ් සභා කාර්යාලය, වකුෆ් විනිශ්චය සභා කාර්යාලය, අංග සම්පූර්ණ ශ්‍රවණාගාරයක්, පුස්තකාලයක්, නවාතැන් පහසුකම් සඳහා කාමර සහ වාහන නැවතුම්පලක් යන අංග ස්ථාපිත කිරීමට නියමිතය.

අදියර 03කින් ක්‍රියාත්මක වන මෙම ගොඩනැඟිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතුවලින් පළමු (භූගත කුළුණු ඉදිකිරීම) හා දෙවන (කොන්ක්‍රීට් ව්‍යුහය) අදියර අවසන්ව ඇති අතර, මේ වනවිට තෙවන අදියරේ (ගොඩනැඟිල්ලේ නිමාව) 2014 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් නොවීමෙන් නැවතී ඇත.

❖ සංවර්ධන වැඩසටහන් වලට අදාල ප්‍රගති වාර්තා නිසි කලට අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරිම.




## 06. මුලා‍ය අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන් සහ වාර්තා

### 6.1 මුලා‍ය අංශය මඟින් ඉටුකරන ලද කාර්යයන්

- වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරිම.
- වාර්ෂික විසර්ජන ගිණුම සැකසිම.
- ගබඩා කලමණාකරනය.
- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් B ගිණුම් කටයුතු.
- වවුචර සඳහා ගෙවීම් කටයුතු.
- වැටුප් හා දීමනා ගෙවිම හා ගිණුම්ගත කිරිම.
- මූල්‍ය පොත්, ලෙජර හා ලේඛන පවත්වාගෙන යාම.
- චෙක්පත් නිකුත් කිරිම.
- මාසික ගිණුම් සාරාංශ සැකසීම.
- භාණ්ඩාගාරය, විගණකාධිපති, අමාත්‍යාංශය වෙත ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

## 6.2 මූල්‍ය වාර්තා


**6.2.1 පුනරාවර්තන** (පිටු අංක - 12

**6.2.2 මූලධන** (පිටු අංක - 13

**6.2.3 අත්තිකාරම් ගිණුම්** (පිටු අංක - 13

# පුනරාවර්ථන වියදමේ මුළු ශුද්ධ ප්‍රතිපාදන. තත්‍ය වියදම අතර විචලතා - 2014

දෙපාර්තමේන්තුවේ නම : **මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු**

වියදම් ශීර්ෂ අංකය : **202**

| වැඩසටහන් අංකය | ව්‍යාපෘති අංකය | උප ව්‍යාපෘති අංකය | වැය විෂය අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | පුනරාවර්තන වියදම්වල විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු | සත්‍ය වියදම රු | ඉතිරිය රු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | <u>පුනරාවර්තන වියදම් වල විස්තරය</u> | | | |
| | | | | | **පුද්ගලික පඩිනඩි** | | | |
| 2 | 1 | 0 | 1001 | 11 | වැටුප් හා වේතන | 15,600,000 | 14,245,280.00 | 1,354,720 |
| 2 | 1 | 0 | 1002 | 11 | අතිකාල හා අනෙකුත් දීමනා | 683,000 | 673,785.00 | 9,215 |
| 2 | 1 | 0 | 1003 | 11 | අනෙකුත් දීමනා | 10,360,000 | 10,358,980.00 | 1,020 |
| | | | | | **ගමන් වියදම්** | | | |
| 2 | 1 | 0 | 1101 | 11 | ගමන් වියදම් - දේශීය | 340,000 | 339,985.00 | 15 |
| 2 | 1 | 0 | 1102 | 11 | ගමන් වියදම් - විදේශීය | 800,000 | 694,912.00 | 105,088 |
| | | | | | **සැපයීම්** | | | |
| 2 | 1 | 0 | 1201 | 11 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය ද්‍රව්‍ය | 700,000 | 698,034.00 | 1,966 |
| 2 | 1 | 0 | 1202 | 11 | ඉන්ධන හා ලිහිසි තෙල් | 1,000,000 | 800,782.00 | 199,218 |
| 2 | 1 | 0 | 1203 | 11 | නිල ඇඳුම් දීමනා | 60,000 | 60,000.00 | - |
| | | | | | **නඩත්තු වියදම්** | | | |
| 2 | 1 | 0 | 1301 | 11 | වාහන | 750,000 | 701,037.00 | 48,963 |
| 2 | 1 | 0 | 1302 | 11 | යන්ත්‍රෝපකරණ | 400,000 | 233,605.00 | 166,395 |
| 2 | 1 | 0 | 1303 | 11 | ගොඩනැගිලි | 195,000 | 194,958.00 | 42 |
| | | | | | **ගිවිසුම්ගත සේවා** | | | |
| 2 | 1 | 0 | 1401 | 11 | ප්‍රවාහන වියදම් | 300,000 | 31,300.00 | 268,700 |
| 2 | 1 | 0 | 1402 | 11 | සංදේශනය | 650,000 | 408,123.00 | 241,877 |
| 2 | 1 | 0 | 1403 | 11 | විදුලිය හා ජලය | 802,000 | 801,471.00 | 529 |
| 2 | 1 | 0 | 1404 | 11 | දේශීය බදු හා කුලී ගාස්තු | 300,000 | 171,112.00 | 128,888 |
| 2 | 1 | 0 | 1405 | 11 | වෙනත් | 8,400,000 | 6,164,427.00 | 2,235,573 |
| 2 | 1 | 1 | 1501 | 11 | නිල ඇඳුම් | 5,000,000 | 4,958,538.00 | 41,462 |
| 2 | 1 | 2 | 1501 | 11 | පොත් දීමනා | 9,000,000 | 8,754,000.00 | 246,000 |
| 2 | 1 | 3 | 1501 | 11 | පෙළපොත් මුද්‍රණය | 2,000,000 | 1,821,448.00 | 178,552 |
| 2 | 1 | 4 | 1405 | 11 | රට ඉඳි | 2,500,000 | 2,448,014.00 | 51,986 |
| | | | | | **ප්‍රදානයන්** | | | |
| 2 | 1 | 0 | 1506 | 11 | දේපළ ණය සඳහා පොළී | 100,000 | 95,152.00 | 4,848 |
| 2 | 1 | 8 | 1508 | 11 | කුරාන් මද්රසා සඳහා මූල්‍ය ආධාර | 700,000 | 696,000.00 | 4,000 |

## <u>මූලධන වියදමේ මුළු ශුද්ධ ප්‍රතිපාදන. සත්‍ය වියදම අතර විචලතා - 2014</u>

දෙපාර්තමේන්තුවේ නම : **මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු**

වියදම් ශීර්ෂ අංකය : **202**

| වැඩසටහන් අංකය | ව්‍යාපෘති අංකය | උප ව්‍යාපෘති අංකය | වැය විෂය අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | පුනරාවර්තන වියදම්වල විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු | සත්‍ය වියදම රු | ඉතිරිය රු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | <u>මූලධන වියදම්වල විස්තර</u> | | | |
| 2 | 1 | 0 | 2001 | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 200,000 | 192,150 | 7,850 |
| 2 | 1 | 0 | 2002 | 11 | යන්ත්‍ර සහ උපකරණ | 200,000 | 16,800 | 183,200 |
| 2 | 1 | 0 | 2003 | 11 | වාහන | 500,000 | 230,500 | 269,500 |
| 2 | 1 | 0 | 2102 | 11 | ලි බඩු හා කාර්යාල උපකරණ | 300,000 | 291,968 | 8,032 |
| 2 | 1 | 0 | 2103 | 11 | යන්ත්‍ර සූත්‍ර හා සවි කිරීම් | 200,000 | 199,450 | 550 |
| 2 | 1 | 0 | 2401 | 11 | පුහුණු කිරීම් | 150,000 | 150,000 | - |
| | | | | | අනෙකුත් මූලධන වියදම් | | | - |
| 2 | 1 | 6 | 2502 | 11 | වෙනත් ආයෝජන-ජාතික මීලාද් සංවර්ධන ව්‍යාපෘතිය | 13,000,000 | 9,532,764 | 3,467,236 |
| 2 | 1 | 7 | 2502 | 11 | වෙනත් ආයෝජන-වෙනත් සංවර්ධන වැඩසටහන් | 6,000,000 | 5,299,359 | 700,641 |
| 2 | 1 | 9 | 2502 | 11 | කාත්තන්කුඩි පල්ලියේ ඉදි කිරීම් | 10,500,000 | 6,491,847 | 4,008,153 |

## <u>අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය - 2014</u>

වියදම් ශීර්ෂ අංකය: 202.00

දෙපාර්තමේන්තුවේ නම: **මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

| අත්තිකාරම් / තැන්පත් ගිණුමේ නම | ගිණුම් අංකය* | දෙපාර්තමේන්තු පොත් අනුව | | | | භාණ්ඩාගාර පොත් අනුව 2014/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | 2014/01/01 දිනට ආරම්භක ශේෂය | වර්ෂය තුල හර කිරීම් | වර්ෂය තුල බැර කිරීම් | 2014/12/31 දිනට අවසාන ශේෂය | |
| | | රු. | රු. | රු. | රු. | රු. |
| I. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් | 202011 | 6,074,327.85 | 1,772,545.00 | 1,300,492.85 | 6,546,380.00 | 6,546,380.00 |
| | 202012 | | 818,626.00 | 873,864.00 | -55,238.00 | -55,238.00 |
| | | 6,074,327.85 | 2,591,171.00 | 2,174,356.85 | 6,491,142.00 | 6,491,142.00 |
| II. අනෙකුත් අත්තිකාරම් | | | | | | |
| III විවිධ අත්තිකාරම් | | | | | | |
| IV තැන්පත් | 6000/0015/0084 | 16,001,529.97 | 300,690.64 | 721,669.00 | 16,422,508.33 | 16,422,508.33 |
| (i) පොදු තැන්පත් | | | | | | |
| (ii) අනෙකුත් තැන්පත් | | | | | | |

## 07. ආගමික හා සංස්කෘතික කටයුතු අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්.

❖ අරාබි විදුහල් ලියාපදිංචි කිරීම, විෂය නිර්දේශ සැකසීම හා එහි පරිපාලන කටයුතු.
❖ හිෆ්ලුල් කුර්ආන් මද්රසා ලියාපදිංචි කිරීම, විෂය නිර්දේශ සැකසීම හා එහි පරිපාලන කටයුතු.
❖ කුර්ආන් මද්රසා ලියාපදිංචි කිරීම, විෂය නිර්දේශ සැකසීම හා එහි පරිපාලන කටයුතු.
❖ අහදියා දහම් පාසල් ලියාපදිංචි කිරීම, විෂය නිර්දේශ සැකසීම.
❖ අහදියා දහම් පාසල් නිල ඇඳුම් බෙදාදීම.
❖ අහදියා දහම් පාසල් ගුරුවරුන්ට පොත් දීමනාවක් ලබා දීම.
❖ හජ් වන්දනා කටයුතු සංවිධානය කිරීම.
❖ වාස විසා නිර්දේශ කිරීම.
❖ ආගම හා ආගමික ආයතන හා සම්බන්ධ පොත් පත් බඩු භාණ්ඩ සඳහා තීරුබදු සහන ලබා දීමට නිර්දේශ කිරීම.
❖ අරාබි විදුහල් වල තෝරාගත් සිසුන් ඊජිප්තුවේ අල් අස්හාර් විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යත්ව වැඩ සටහනකට යොමු කිරීම.

මේ සඳහා අරාබි විදුහල්වලින් අයදුම්පත් 50ක් ඉදිරිපත් වූ අතර අයදුම්කරුවන් අතුරින් ඊජිප්තුවේ අල් - අස්හර් විශ්ව විද්‍යාලයේ මාස 03ක ඉස්ලාම් ෂරීආ අධ්‍යාපන පාඨමාලාව සඳහා පල්ලි පූජකවරුන් (ඉමාම්වරු) 05 දෙනෙකුද, ඉස්ලාම් අධ්‍යාපන උපාධි අපේක්ෂක පාඨමාලාව සඳහා අරාබි විදුහල් ශිෂ්‍යයන් (මවුලවි සිසුන්) 10 දෙනෙකුද තෝරාගෙන ඇත. උසස් අධ්‍යාපන කටයුතු සඳහා විදේශගතවන සිසුන්ට එම අධ්‍යාපන ආයතනවලට ඇතුලත්වීම සඳහා නිර්දේශ ලිපි නිකුත් කිරීමද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි.

❖ රාමසාන් උපවාස සමයේදී ඊජිප්තුව සහ ඉරානය යන රටවලින් පැමිණි ආගමික නායකයින්ගේ ආගමික වැඩසටහන් පැවැත්වීම.

රාමසාන් උපවාස සමයෙහි ශුද්ධ වූ අල්කුර්ආනය පාරායණය කිරීමට හා පැහැදිලි කිරීමට ඊජිප්තුවේ සිට ආගමික නියෝජිතයෙකු පැමිණි අතර, ඔවුන් දිවයින තුල ගත කරන ලද කාලසීමාව සඳහා අවශ්‍ය පහසුකම් සහ භාෂා පරිවර්තකයෙකු මෙම දෙපාර්තමේන්තුව මගින් සපයා දෙන ලදී. එම නියෝජිතයන් පොළොන්නරුව, අනුරාධපුර, මඩකලපුව,අම්පාර, මහනුවර සහ කොළඹ යන දිස්ත්‍රික්කයන්හි අදාල ආගමික කටයුතුවල නිරතවිය.

❖ රාමසාන් උපවාස සමයේදි මුස්ලිම් පල්ලිවලට හා බැතිමතුන්ට අවශ්‍ය රටඉදි බෙදා හැරීමට ක්‍රියා කිරීම.

උපවාස සමය තුල බැතිමතුන් වෙනුවෙන් සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඉරාකය යන රටවල්වලින් මෙරටට පරිත්‍යාග කරන ලද රටඉඳි මෙට්‍රික් ටොන් 348 ක් දිස්ත්‍රික් මට්ටමින් මහ පල්ලි හරහා බෙදාහැරීමට කටයුතු කරන ලදී. මේ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වියදම් යටතේ වෙන්කරන ලද රුපියල් මිලියන 09 ක ප්‍රතිපාදන යොදාගන්නා ලදී.

❖ ජාතික මිලාදුන් නබි ජන්ම දින රාජ්‍ය උත්සවය පැවැත්වීම.

ලෝකවාසී මුස්ලිම් ජනතාව ඉතා භක්තියෙන් යුතුව සමරන ශුද්ධ වූ මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ ජන්ම දිනය 2014.01.14 වන දිනට යෙදි තිබූ අතර එය කලුතර දිස්ත්‍රික්කය මුල්කර ගනිමින් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී.

❖ ජාතික මිලාදුන් නබි ජන්ම දිනය නිමිත්තෙන් පළාත් හා ජාතික තරඟ පැවැත්වීම.

වාර්ෂිකව පවත්වන මෙම උත්සවය නිමිත්තෙන් දිවයින පුරා පාසල් සිසු සිසුවියන් අතර කථික, කෙටි කථා, රචනා, පද්‍ය රචනා, ගායනා, අරාබි අක්ෂර මෝස්තර සහ අල්කුර්ආන් පාරායණය කිරීම යන ඉසව් යටතේ තරඟ පවත්වනු ලබයි. එක් එක් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල අධීක්ෂණය යටතේ පළාත්

මට්ටමින් තරඟ පවත්වා එහි පළමු, දෙවන සහ තෙවන ස්ථාන ලබා ගන්නා තරඟකරුවන් සමස්ත ලංකා අවසාන මහා තරඟයට යොමුකර ජයග්‍රාහකයින් තෝරාගනු ලබයි.

| 2014 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මිලියන) | 2014.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන) | 2014.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 2.3 | 2.0 | සියලු පළාත් තරඟ පවත්වා අවසන් කර සමස්ත ලංකා අවසන් මහා තරඟය 2014 නොවැම්බර් මස 29,30 යන දිනයන්හිදී කොළඹ-12 පාතිමා බාලිකා විද්‍යාලයේදී පවත්වන ලදී. |

- ❖ වාර්ෂික කලාභූෂණ සම්මාන උලෙළ සඳහා මුස්ලිම් කලාකරුවන්ගේ නාම යෝජනා ඉදිරිපත් කිරිම.
- ❖ මුස්ලිම් ලේඛකයන් දිරිමත් කිරිම උදෙසා ඔවුන්ගේ ප්‍රකාශන මිලදි ගැනිම හා ඒවා මුස්ලිම් පාසල් පුස්තකාල වලට බෙදා හැරිම.
- ❖ ඉස්ලාමීය පූජකවරුන් (මවුලවිවරු) සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම

2014 වර්ෂයට අයදුම් කරන ලද හැඳුනුම්පත් 862ක් අතුරින් 2014.12.31 දින වනවිට මවුලවි හැඳුනුම්පත් 110 ක් නිකුත් කර ඇත. අඩු පාඩු සකස් කර අයදුම්කරන ලද අනෙකුත් හැඳුනුම්පත් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතී.

- ❖ අල්කුර් ආන් තරඟ පැවැත්විම හා එමඟින් ජාත්‍යන්තර තරඟ සඳහා සුදුස්සන් තෝරා ගැනිම.
- ❖ රාජ්‍ය උත්සව අවස්ථාවන් සඳහා ඉස්ලාම් ආගමික පූජක නියෝජනය සම්බන්ධීකරණය හා අවශ්‍ය කටයුතු සම්පාදනය.

| | 2014 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මිලියන) | 2014.12.31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (රු. මිලියන) |
| I. නිල ඇඳුම් ලබාදීම. | 5.0 | වර්ෂයට අදාල නිල ඇඳුම් මිලදී ගන්නා ලදී. | 4.95 |
| II. පොත් දීමනාව | 9.0 | ලබාදී අවසන් කර ඇත. | 8.75 |
| III. අහදියා දහම් පාසල් සඳහා විෂය නිර්දේශයන්ට අනුකූලව සකසන ලද පෙළ පොත් 09ක් මුද්‍රණය කිරීම | 2.0 | පෙළපොත් සංස්කරණ කටයුතු නිමකර ඇත. | 1.82 |
| IV. අහදියා දහම් පාසල් ප්‍රශ්න පත්‍ර ඇගයීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීම. | 0.35 | විභාගය පවත්වන ලදී. | 0.35 |

## **08.** වකුෆ් හා පල්ලි පරිපාලන අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්.

- ❖ මුස්ලිම් පල්ලි හා පුණ්‍යාධාර අරමුදල් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරමින් ඒ අනුව,
  - ➢ දිවයිනේ සියළු දිස්ත්‍රික්කයන්හි මුස්ලිම් පල්ලි වල පරිපාලන කටයුතු කිරිම.
  - ➢ මුස්ලිම් පල්ලි ලියාපදිංචි කිරිම.
  - ➢ පල්ලි දායක සභාවල භාරකරුවන් පත්කිරීම.
  - ➢ පල්ලිවල වාර්ෂික ගිණුම් වාර්තා ලබා ගැනීම හා පරීක්ෂා කර මුස්ලිම් පුණ්‍යාධාර භාර අරමුදලට දායක මුදල් ලබා ගැනිම හා අරමුදල පවත්වාගෙන යාම.
  - ➢ මුස්ලිම් පල්ලි දායක සභාවල ගැටලු, අභියාචනා, පෙත්සම් සම්බන්ධිකරණය කිරිම, සමථයකට පත්කල නොහැකි ගැටලු වකුෆ් මණ්ඩලයට යොමු කිරීම

වකුෆ් සභා කාර්යාලය

නව පල්ලි 10 ක් මෙම වර්ෂයේදී ලියාපදිංචිව ඇති අතර පල්ලි භාරකරුවන් 350 දෙනෙකු සඳහා නව පත්වීම් ලබාදී ඇත. වකුෆ් සභාව විසින් විභාග කර ලබාදුන් තීරණයන්ට එරෙහිව වකුෆ් විනිශ්වය සභාවට ඉදිරිපත් කළ නඩු ගණන 09කි. ඇපැල් උසාවියට 02 නඩුවකුත්, මහේස්ත්‍රාත් උසාවියට නඩු 01කුත් යොමුකර ඇත. දැනට විභාග වෙමින් පවතින තීන්දුවක් ලබා නොදුන් නඩු ගණන 25 කි.

වකුෆ් විනිශ්වය සභා කාර්යාලය

අධිකරණ කොමිෂන් සභාව මගින් පත්කරන ලද සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වකුෆ් විනිශ්වය සභාවේ මාසික රැස්වීම් වාර ගණන 02කි. 2014 වර්ෂය සඳහා මුස්ලිම් පල්ලිවලින් ඉදිරිපත්වූ නඩු 09 න් නඩු 05ක් විනිශ්වය සභාව වෙත යොමුකර ඇති අතර විභාග වෙමින් පවතින නඩු ගණන 07කි. මීට අමතරව 2013 වර්ෂයේදී ඉදිරිපත් වූ නඩු 02ක් ද විභාග වෙමින් පවතී. නඩු 07ක් සඳහා නියෝග ලබාදී ඇත.

## **09.** අභ්‍යන්තර විගණන හා විමර්ෂන අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්

දෙපාර්තමේන්තුවේ මූල්‍ය හා පාලන කටයුතු වල අභ්‍යන්තර පාලනය ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට අදාලව විගණනයන් සිදු කිරිම. එහිදි,

- ❖ විගණන විමසුම් වලට පිලිතුරු සැකසීම
- ❖ මුස්ලිම් දේවස්ථාන පරීක්ෂාව, ඒවායේ ආදායම් වියදම් වාර්තා විගණනය හා විමර්ෂණය.
- ❖ වකුෆ් මණ්ඩලය මඟින් ලැබෙන පෙත්සම් හා චෝදනා පරීක්ෂා කර බලා වාර්තා කිරිම.
- ❖ වාර්ෂික විගණනයන් සිදු කිරිම.

2014 වර්ෂයට අදාල අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන විමසුම් සංඛ්‍යාව - 02
2014 වර්ෂයට අදාල රජයේ විගණකාධිපති විගණන විමසුම් සංඛ්‍යාව - 02

## 10. දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි වූ බාධාවන් සහ දුෂ්කරතා

**2014.12.31 දිනට දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.**

| | 2014 වර්ෂය සඳහා ප්‍රතිපාදන | | 2014.12.31 දිනට මුළු වියදම | |
|---|---|---|---|---|
| | වාර්ෂික ඇස්තමේන්තුව (රු.) | මුළු ශුද්ධ ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | ප්‍රතිශතය |
| ප්‍රාග්ධන වියදම් | 20,550,000.00 | 31,050,000.00 | 22,404,837.75 | 72% |
| පුනරාවර්තන වියදම් | 71,140,000.00 | 60,640,000.00 | 55,350,943.41 | 91% |
| එකතුව | **91,690,000.00** | **91,690,000.00** | **77,755,781.16** | **84.80%** |

ඉහත සඳහන් වැය විස්තර පරිදි දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සපුරා ගැනීමේදී නිසි කලට අක්මුදල් ප්‍රමාණවත් පරිදි නොලැබීම යම් පමණකට බාධාවක් විය. එම තත්වය මත සමස්ත මූල්‍ය කාර්ය සාධනයේ ප්‍රතිශතය 84.80% ක අගයක් පෙන්නුම් කරන බව සඳහන් කරමි. මෙයට අතිරේක වශයෙන් පුනරාවර්තන වියදම්හි වියදම් පාලනයද ඊට අදාල ප්‍රතිපාදන වියදම් නොකිරීමට හේතුවක් වූ බව වාර්තා කරමි.

දෙපාර්තමේන්තුවේ සියලුම මට්ටම් වල පුරප්පාඩු විශේෂයෙන් ම විධායක සේවා ගණයන්හී ඇති පුරප්පාඩු කාර්ය සාධන ඉලක්කයන් සපුරා ගැනීමට බාධාවක් විය.

දෙපාර්තමේන්තුවේ කාර්ය මංඩලය සඳහා ප්‍රමාණවත් ඉඩපහසුකම් සහ ඒහා බැඳි අනෙකුත් පොදු පහසුකම් ප්‍රමාණවත් නොමැති වීම රාජකාරී ඉටුකිරීමේදී දුෂ්කරතාවයක් විය.

ඉහත බාධක සහ දුෂ්කරතා මධ්‍යයයේ දෙපාර්තමේන්තුවේ අරමුණු, ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා 2014 වර්ෂයේදී කටයුතු කරන ලද බව සඳහන් කරමි.

**වෙබ් අඩවිය** www.muslimaffairs.gov.lk
**විද්‍යුත් තැපැල** dir@muslimaffairs.gov.lk
**දුරකථන අංක** අධ්‍යක්ෂ - 011-2675367
කාර්යාලය - 011-2672646
**ෆැක්ස් අංකය** 011-2692147